GMOA

ESTABLISHED IN 1926

TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk


30-05-2012

# මාධ්‍ය නිවේදනයයි

## ශ්‍රී ලංකාවේ ජනතාවට කරන කාරුණික දැනුම්දීමයි

මාලඹේ හි පිහිටුවා ඇති, අවශ්‍ය කිසිඳු අනුමැතියකින් තොරව පවත්වාගෙන යනු ලබන පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය යුනවෙන් හඳුන්වන ආයතනයේ සැබෑ තතු සියල්ල දැන් පංච පුද්ගල කමිටුව හරහා හෙලි වී ඇත. එයට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ කිසිඳු අනුමැතියක් නොමැති බවත් එම ආයතනයෙහි ප්‍රමිතිය පරීක්ෂාවට ලක් නොවන බවත් ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් පත් කරන ලද මෙම පංච පුද්ගල කමිටු වාර්තාවෙන් තහවුරු කර ඇත. එහෙත් මෙම ව්‍යාපාරික ආයතනය එම ආයතනය සතුව වෛද්‍ය සිසුන්ගේ පුහුණුව සඳහා පෞද්ගලික ශික්ෂණ රෝහලක් නොමැති බව වසන් කර ගෙන ලංකාවේ අහිංසක දෙමාපියන් නොමග යැවීමේ අරමුණින් රූපවාහිණී මාධ්‍යයෙන් ප්‍රචාරණය ආරම්භකර ඇත.

වෛද්‍යවරයෙකු වීම සඳහා බොහෝ දෙනෙකුගේ සිතෙහි පවත්නා සිහිනය ඳඩම්මා කරගෙන වෛද්‍ය ප්‍රචාරණයේ යෙදෙන මෙම ආයතනයේ දැන්වීම් වලට නොරැවටෙන ලෙස අපි ශ්‍රී ලාංකික ජනතාවගෙන් ඉල්ලා සිටිමු. එමෙන්ම පංච පුද්ගල කමිටු වර්තාවේ නිරීක්ෂණ මත පිහිටා මෙම ආයතනයෙට එරෙහිව නීතිමය පියවර ගන්නා ලෙස රජයට බලකර සිටින්නෙමු.

රජයේ ප්‍රධාන පාර්ශවකාර පක්ෂයක් වන ආණ්ඩුපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් නායකත්වය සපයන මහජන එක්සත් පෙරමුණ මෙම ආයතනය සම්බන්ධව දරණ මතය අපගේ ඇගයීමට ලක් වන අතර රජයේ මාධ්‍ය මෙවැනි ව්‍යාපාරික ආයතනයක් විසින් ජනතාව නොමගයැවීමේ කටයුත්තට යොදා ගැනීමට ඉඩ ලැබීම සම්බන්ධව පරීක්ෂණයක් පවත්වන ලෙෂ ඉල්ලා අප ජනමාධ්‍ය අමාත්‍යවරයාට පැමිණිලි කිරීමට බලාපොරොත්තු වෙමු.

ස්තූතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්

වැඩිදුර විස්තර - වෛද්‍ය නලින් ආරියරත්න - 071480042
වෛද්‍ය නවීන් ද සොයිසා - 0718582444